5 ශ්‍රේණිය - සිංහල

දෙවන වාරය- සිසු සටහන 18

**ප්‍රාණවාචී ඒකවචන උක්ත පද/බහුවචන උක්ත පද සහිත වර්තමාන කාල වාක්‍ය ලිවීම**

- **ගොයම් කපන දා ඡේදයේ ඇතුළත් ප්‍රාණවාචී ඒකවචන සහ බහුවචන වර්තමාන කාල වාක්‍ය වෙන්කර ලියන්න.**

### ගොයම් කපන දා

අපේ නිවස අසල ඇති කරලියැද්දේ වෙල් යායේ ගොයම් පැසී ඇත. කුකුළා කුක්කු කුක් කුක්කු කුක් යැයි හඬ නඟයි. කුරුල්ලෝ කිචි බිචි යැයි නාද කරති.

අපේ බාප්පා සමඟ ලොකු මාමාත් පොඩි මාමාත් උදෑසන අපේ නිවසට පැමිණෙති. අම්මා සහ පුංචි අම්මා කුස්සියේ ඇඹුලට අවශ්‍ය දෑ සූදානම් කරති.

"අපි උදේ අට වෙනකොට ඇඹුල අරන් එනවා" යැයි අම්මා තාත්තාට ඇසෙන්නට කියයි.

"හරි, හරි ඒ වෙලාව හොඳයි" යැයි තාත්තා ඒ සඳහා පිළිතුරු දෙයි.

"අම්මේ මමත් එනවා ඇඹුල ගෙනියන කොට" නංගී හඬ නඟා පවසයි.

සිරිමල්, තිසර සහ යසිරු ද උදේ ම නියර දිගේ අපේ කුඹුරට එති. උදේ හයහමාර වන විට තාත්තා සමඟ බාප්පාත් ලොකු මාමාත් කුඹුරට පැමිණෙති. පොඩි මාමා, සුනිල් මාමා සහ වික්‍රම් මාමා ද කුඹුර අසල සාකච්ඡාවක යෙදෙති.

"අයියේ අපි මේ පැත්තේ ඉඳන් ගොයම් කපමු" සුනිල් මාමා යෝජනා කරයි.

"ඒක හොඳයි මල්ලී. එහෙනම් දැන් අපි ගොයම් කපන්න පටන් ගනිමු" යැයි තාත්තා සැම දෙනාට ම ඇසෙන්නට උස් හඬින් කියයි.

පහත සඳහන් වර්තමාන කාල ඒකවචන වාක්‍ය බහුවචන වාක්‍ය බවට හරවා ලියන්න.

1. මල්ලී මිදුලේ සෙල්ලම් කරයි.

   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. ළමයා අලංකාර ලෙස චිත්‍රය පාට කරයි.

   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. ශිෂ්‍යයා උදෑසනින් ම පාසලට යයි.

   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. මී මැස්සා මීවදය සාදයි.

   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. සීයා උදෑසන ම පුවත්පතක් කියවයි.

   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

පහත සඳහන් වර්තමාන කාල බහුවචන වාක්‍ය ඒකවචන වාක්‍ය බවට හරවා ලියන්න.

1. ගුරුවරු උදෑසනින් ම පාසලට එති.

   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. ළමයි සමඟියෙන් සෙල්ලම් කරති.

   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. පැණි කුරුල්ලෝ මල් පැණි බොති.

   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. අයියලා පුස්තකාලයේ පොත් කියවති.

   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. සිංහයෝ කැලෑවේ ජීවත් වෙති.

   . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .